29

සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය / vdJ ,y / My Number — ME/E/18/සබර/ව

ඔබේ අංකය / ckJ ,y / Your Number —

දිනය / jpfjp / Date — 2017.08. 23

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක

**සබර/2017/05**

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා
කලාප අධ්‍යාපන කාර්යාල වල
සියළුම රියදුරු මහතුන් වෙත.

**<u>වාහන පදවන අවස්ථාවල දූරකථන භාවිතය හා වාහන නඩත්තුව පිළිබඳව</u>**

රජයේ වාහන භාවිතයේදී වාහන වල ගමන් ගන්නා නිළධාරීන්ගේ ජීවිත පිළිබඳ වගකීම,ආරක්ෂිතව රාජකාරී ගමන අවසන් කර නිළධාරීන් නියමිත ස්ථාන වල බැස්සවීම , වාහනයේ නිසි භාවිතය හා වාර්තා පවත්වා ගැනීම හා සම්බන්ධ වගකීම රියදුරුට අදාළ වේ.

01. ඒ අනුව රියදුරු මහතුන් වාහන පදවන අවස්ථා වල ජංගම දූරකථන භාවිතය සිදු නොකළ යුතුය.
02. දූරකථන ඇමතුම් මගින් පණිවුඩ ලබා දීම හෝ ලබා ගැනීම අත්‍යාවශ්‍ය නම් වාහනය ආරක්ෂිතව නතර කර එම දූරකථන පණිවුඩය ලබා දී හෝ ලබා ගෙන නැවත ගමන ආරම්භ කළ යුතුය.
03. තමන්ගේ රාජකාරී ඉටු කරන වාහනය නියමිත වේලාවට වාර සේවා කර ගැනීම, සෝදා පවිත්‍රව තබා ගැනීම, වාහනයේ අඩුපාඩු සොයා බලා සකස් කර ගැනීම රියදුරුගේ වගකීම වේ.
04. නියමිත දිනට ධාවන සටහන් ලියා විගණනයට ඉදිරිපත් කිරීමට ද රියදුරු මහතුන් වග බලා ගත යුතුය.

එසේම උක්ත කරුණට අදාළව මගේ අංක ME/F/9 හා 2016/12/28 දිනැති ලිපිය කෙරෙහිද ඔබගේ දැඩි අවධානය යොමු කර ක්‍රියා කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

මහින්ද එස් වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත - 01.පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ- අ.ක.ස
02.සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්- අ.ක.ස
03.අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිළධාරීන්- අ.ක.ස

ගරු අමාත්‍යතුමා / Hon.Minister — Office-045-5623222,045-2287306, Residence-045-2222538, Mobile-077-9102001, Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් / Secretary — Office-045-2223015, Residence-045-2232985, Mobile-071-4402000, email-msweerasooriya@gmail.com

කාර්යාලය / Office — නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542, Fax-045-2228042

O/C
8/23